# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,002 — 1933ක්වූ සැප්තැම්බර් මස 1 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Galle No. 134.**—දකුණු දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1933ක්වූ ඔක්තෝබර් මස 16වෙනි දිනවූ සඳුදා පස්වරූ 2ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ වැල්ලබඩ පත්තුවේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 25ක්.

මූල් සිතියමේ නො. 11,854. ගම—කරන්දෙනිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අත්කරගන්න මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 58 | ඇද්දෙඹවගහවත්ත .. | — .. | කරන්දෙනියේ පදිංචි පත්තිනියා හකුරු ලෙයිනො, මිලිනා සහ අගිනිස් | ඉඩම .. | 1 0 0 | 115* |
| | | | | වැවිල්ල .. | — | 142·50 |

මූල් සිතියමේ නො. 13,076. ගම—කොබෙයිතුඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අත්කරගන්න මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 4 | පරගහඋඹමුල්ල .. | — .. | රජසන්තක .. .. | පැලෑටි සහිත කැලෑව | 0 1 15 | 110† |

මූල් සිතියමේ නො. 13,134. ගම—කරන්දෙනිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අත්කරගන්න මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 2 | කොස්ගහවත්ත .. | — .. | ඉලන්දරිදේව අමදෙරිස් .. | ඉඩම .. | 0 2 6 | 95 |
| | | | | වැවිල්ල .. | — | 6 |
| 3 | අඹගහවත්ත .. | — .. | ඉලන්දරිදේව පොඩිබා .. | ඉඩම .. | 0 0 10 | 95 |
| | | | | වැවිල්ල .. | — | 15 |
| 4 | දෙල්ගහවත්ත .. | — .. | එම .. | කුරුඳු .. | 0 1 10 | 95 |
| | | | | වැවිල්ල .. | — | 28 |
| 5 | හෙල්ලිගහවත්ත .. | — .. | ඉලන්දරිදේව මැන්දිස් .. | කුරුඳු .. | 0 0 37 | 95 |
| | | | | වැවිල්ල .. | — | 68 |
| 6 | වෙරළුගහවත්ත .. | — .. | ඉලන්දරිදේව බබා .. | කුරුඳු .. | 0 0 37 | 95 |
| | | | | වැවිල්ල .. | — | 50 |
| 7 | ගොරකගහවත්ත .. | — .. | ඉලන්දරිදේව ඉන්වා .. | ඉඩම .. | 0 2 10 | 95 |
| | | | | වැවිල්ල .. | — | 100 |
| 8 | දෙල්ගහවවත්ත .. | — .. | ඉලන්දරිදේව කරොලිනිස් .. | රබර් .. | 0 0 4 | 95 |
| | | | | වැවිල්ල .. | — | 7 |

මූල් සිතියමේ නො. 14,084. ගම—කිතගහතොට නොහොත් මහඒදන්ඩලය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අත්කරගන්න මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 1 | මුල්කැටියෙතොට .. | — .. | තොම්මයාහකුරු ජේරෝනිස් .. | ඔඹට .. | 0 2 29 | 120* |
| | | | | වැවිල්ල .. | — | 32·50 |

මූල් සිතියමේ නො. 14,314 ගම—අළුත්වල.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අත්කරගන්න මිල, රු. |
|---|---|---|---|---|---|---|
| 1 | ඇල්හේනෙඹිට .. | — .. | රජසන්තක .. .. | ඔඹට .. | 0 2 10 | 70 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | ඔහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| | **මුල් සිතියමේ නො. 14,412. ගම—කිනගහකොට නොහොත් මහජ්දන්බලග සහ බොරකන්ද.** | | | | | |
| 1 | කොරඑමාහයපහල කැබැල්ල | — .. | හොඩිමයාහකුරු කිචොරිස් සහ කලුවහකුරු ලෙයනෙරිස් | ඔවිට .. | 0 3 4 | 75 |
| 2 | එම .. | — .. | කළුවාහකුරු ලෙයනෙරිස් .. | කුඹුර .. | 0 0 11 | 75 |
| 3 | කිනගහකොටපහල කුඹුර නොහොත් පාලමට ඉහල කැබෙල්ල | — .. | ඉලන්දුරිදේව පිංචෝරිස් .. | එම .. | 0 2 27 | 75 |
| 4 | එම .. | — .. | පේදුරුවාහකුරු ජේම්ස් .. | එම .. | 0 0 22 | 70 |
| 5 | කිනගහකොටපහල කැබෙල්ල | — .. | හොඹිමයාහකුරු කිචෝරිස් .. | ඔවිට .. | 0 3 31 | 70 |
| 6 | පාලමට ඉහලකුඹුර .. | — .. | රත්දෙණි පදිංචි ඇල්බට් මිරඳු සහ ක්ලැමන්ට් සිඤ්ඤෝගේ උරුමක්කාරයෝ | කුඹුර .. | 0 0 26 | 70 |
| | **මුල් සිතියමේ නො. 14,444. ගම—එගොඩගොඩ හික්කඩුව උතුර.** | | | | | |
| 1 | මඩබොක්කඅද්දරකැරව | — .. | රජසන්තක.. .. | දෙනිය .. | 1 2 6 | —‡ |
| 3 | පන්විල .. | — .. | හික්කඩුවේ පදිංචි වූම්පිගුනවර්ධන | කුඹුර .. | 0 3 31 | —§ |
| 8 | මඩබොක්කඅද්දරකැරව | — .. | රජසන්තක.. .. | දෙනිය .. | 0 0 26 | —‡ |
| | **මුල් සිතියමේ නො. A 35. ගම—නින්දන.** | | | | | |
| 1 | ගලගම නොහොත් ගල ගාව | — .. | වේරගොඩ පදිංචි ලොකුගේ අල්විස් | කුඹුර .. | 0 0 16 | 50 |
| | **මුල් සිතියමේ නො. A 45. ගම—කැටන්තොට.** | | | | | |
| 1 | ඇලමෝදර ඔබඩඔවිට වෙල | — .. | මහඅම්බලංගොඩ පදිංචි කේ. අන්දිරිස් | කුඹුර .. | 0 0 26 | 75 |
| 2 | එම .. | — .. | රජසන්තක.. .. | දෙනිය .. | 0 1 19 | 60 |
| 3 | එම .. | — .. | මහඅම්බලන්ගොඩ පදිංචි ඇම්. උපාරිස් | කුඹුර .. | 0 0 35 | 70 |
| | **මුල් සිතියමේ නො. A 46. ගම—උඟරවත්ත.** | | | | | |
| 1 | හෙරෙන්ගගවත්තඅද්දර නොහොත් මෙරෙන්කු ගෙවත්තඅද්දර | — .. | රජසන්තක.. .. | දෙනිය .. | 0 1 6 | 40 |

* මෙම ඉඩම් මීට ඉහතින් ගැණුම්කාරයෝ මුදල් සම්පූර්ණයෙන් නොගෙව් නිසා ආපසු විකුණනු ලැබේ.

† මෙය ඉඩම් විකිනීම සම්බන්ධව තිබෙන රෙගුලාසි 58 සහ 59 අනුව කොළඹයිතුඩුවේ පිහිටි පශ්චිමාරාමය පන්සල වෙනුවෙන් ගෞ. ඇන්. සිරිධම්මතෙරුන්නාන්සේට විකුණනු ලැබේ.

‡ කහනම් ඉඩම් (විකිනීමට නොවේ).

§ මෙය වැසියන් සන්තක කරණු ලැබේ.

මෙම ඉඩම් සම්බන්ධව වැඩිවිස්තර ගාල්ලේ කච්චේරියේ මහ ඒජන්ත උන්නාන්සේගෙන් දූනගන්ට පුළුවන, ඒවාගේ සිතියම් සර්වෙයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1933ක්වූ අගෝස්තු මස 29වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. පී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

වර්ෂ 1933ක්වූ ඔක්තෝබර් මස 16වෙනි දින පස්වරු 2.30ට, දකුණු පලාතේ ආණ්ඩුවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින්, මිනිරන් තිබෙනවායයි විශ්වාසකරණ ගාලු දිස්ත්‍රික්කේ පිහිටි මෙහි පහත විස්තර සඳහන් ඉඩමේ මිනිරන් හෑරීමේ අයිතිවාසිකම මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දූනුම්දෙමි.

1. මිනිරන් හෑරීමේ බලය ජී. ඒ. ඒ. 135 දරණ ෆෝරමයේ සඳහන් රෙගුලාසි සහ කොන්දේසිවලට යටත්ව අවුරුදු පහකට බදුදෙනු ලැබේ. (එකී ෆෝරමයේ පිටපත් ගාල්ලේ කච්චේරියෙන් ඉල්ලා ලබාගත හැක.)

2. අවුරුද්දකට බදු මුදල රුපියල් 10ක් වේ.

3. තක්සේරු මිල රුපියල් එකසියයක් (100)යක් වේ. වැඩි ඉල්ලුම්කාරයා ඔහුගේ ඉල්ලීම රුපියල් 100කට වැඩි වූනොත් ගැනුම්කාරයා වෙනු ලැබේ.

4. (a) ඉල්ලුම්කාරයා ගැනුම්කාරයා හැටියට පිළිගත් කාට පසු, මීට ඉහතින් මුදලක් තැන්පත් කලා හෝ නොකලා හෝ ඉල්ලුම්කරනලද මුදලෙන් සියයට 10ක් එවලේම ආණ්ඩුවේ මහා ඒජන්ත උන්නාන්සේ වෙත තැන්පත් නොකලොත්, එසේම විකිනීමේ කොන්දේසිවලට අත්සන් නොකලොත් ඉල්ලීම බාරනොගනු ලැබේ.

(b) ආණ්ඩුවේ මහා ඒජන්ත උන්නාන්සේ, වෙන්දේසියේදී යම් ඉල්ලීමක් පිළිගන්ට මත්තෙන් ඉල්ලුම්කාරයාගේ නියම නාමය ගැනත්, ඔහුට තැන්පත්කරන්ට වුවමනා මුදල ගෙවන්ට පුළුවන්ද යන වගත් ඒත්තුගතයුතුවේ. එසේ ඒත්තු නොගත්තොත්, ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේපකර, එබඳු ඉල්ලීමක් නොකලාසේ වෙන්දේසිය නොකඩවා ගෙනයනවා ඇත.

5. ගැනුම්කාරයා වෙන්දේසියේ දිනේ සිට මාසයක් ඇතුළත මිලට ගත් මුදලේ ඉතුරු කොටස ආණ්ඩුවේ මහා ඒජන්ත උන්නාන්සේට ගෙවියයුතුවේ. එසේ බැරිවූනොත්, මිලයට ගැනීම අවලංගු හැටියට සලකා බද්ද වෙනුවෙන් ගෙවනලද සියයට 10යේ මිළ කොටස සහ වෙනත් මුදල් රජසන්තක කරනවා ඇත.

6. නියමකරපු කාලය ඇතුළත, මිලට ගත් මුදලේ ඉතුරු කොටස ආණ්ඩුවේ මහා ඒජන්ත උන්නාන්සේට ගෙවා සම්පූර්ණ කලාම ආණ්ඩුවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් ගැනුම්කාරයාට බද්දක් දෙනවා ඇත.

7. බද්ද සම්පාදනයකිරීමට ගාස්තුව වශයෙන් රුපියල් විස්සක් (රු. 20)ක් හෝ මිලට ගත් මුදලෙන් සියයට හතරක් යන දෙකින් අඩු මුදලක් ගෙවියයුතු වේ. මේ මුදල වෙන්දේසි දිනයේදීම ගෙවන්ට ඕනෑවේ.

8. වෙන්දේසි දිනයේදී ඉඩමේ තිබෙන දුවවල සම්පූර්ණ වටිනාකම ගැනුම්කාරයා විසින් ගෙවන්ට ඕනෑවේ.

9. බද්ද අවසානයේදී භාරනලද පතල් සියල්ලම බදුකාරයා විසින් ඔහුගේ වියදමින් වැස්සවිය යුතුයි.

ජේ. බී. බ්‍රවුන්,
ආණ්ඩුවේ මහ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1933ක්වූ අගෝස්තු මස 28වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ගාලු දිස්ත්‍රික්කේ වැල්ලබඩපත්තුවේ කිරිපැද්දෙ පිහිටි අංක 33 දරණ කැලෑ මැනීමේ මුල් සිතියමේ යක්කටුවේ නහනම්කැලේ, යක්කටුවේ කැලෑ වැවීමේ අංක 1 දරණ කොඨාසයයි කියන රූඩ් 1යුත් පර්චස් 38ක ප්‍රමාණ සෑම පැතිවලින්ම යක්කටුවේ කැලෑ වැවිල්ලේ අංක 1 දරණ කොඨාසයෙන් මායිම්වූ බෙදා වෙන්කරනලද බිම්කැබෙල්ලක් වේ.

**No. 10,732, S. O.**—ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1933ක්වූ ඔක්තෝබර් මස 27වෙනි දිනවූ සිකුරාදා පෙරවරු 9ට මහගම තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. බස්නාහිර දිසාවේ කළුතර පලාතේ නැගෙණහිර පස්දුන්කෝරලේ ගහබොඩපත්තුවේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 23ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 139. ගම— කුඩලිගම (කොටසක්).

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 16 | රනිකුඹුරේගොඩැල්ල .. | ආණ්ඩුව සහ කුමාරගේ සුදප්පු .. .. | වත්ත .. | 0 | 1 | 4 |
| 18 | රනිකුඹුරේගොඩැල්ලඹිට | එම සහ එම ඔම්පිසිංඤෝ සහ සහෝදරයෝ .. | ඹිට .. | 0 | 0 | 14 |
| 19 | ලිරෙක්කුඹුරේගොඩැල්ල. | එම සහ එම දිනෝරිස්අප්පු .. .. | රබර් .. | 0 | 1 | 4 |
| 26 | දෙල්ගහලන්ද .. | එම, (1) කුමාරගේ විලියම්සිංඤෝ, (2) ගමගේ මංගෝහාමි යන අයවළුන්ගේ වගාව | එම .. | 0 | 2 | 11 |
| 28 | නැකතිගේවත්තෙ පිටකට්ටිය | එම සහ (1) පතිරගේ හර්මානිස්අප්පු, (2) එම බෝලින්සිංඤෝ, (3) මල්ලවආරච්චිගේ අරනේරිස්අප්පු | එම .. | 0 | 1 | 36 |
| 29 | දේවාලේවත්ත .. | ආණ්ඩුව සහ ගමගේ දොන් සයිමන් .. .. | එම .. | 0 | 3 | 0 |
| 40 | දෙමල්ලේකනත්ත .. | එම, (1) එම ලුවිස්සිංඤෝ, (2) එම සරදියෙල්අප්පු .. | එම .. | 0 | 3 | 8 |
| 41 | එම .. | ආණ්ඩුව සහ ගමගේ හලනිස්සිංඤෝ සහ තවත් අය .. | එම .. | 0 | 0 | 20 |
| 42 | කුසිගෙදරමනෙතපිටකට්ටිය | එම සහ එම සයිමන්අප්පු .. .. | පොල්වත්ත .. | 0 | 0 | 39 |
| 43 | කුසිගෙදරකනත්ත .. | එම සහ එම මවලින්සිංඤෝ .. .. | රබර් .. | 0 | 0 | 32 |
| 44 | ගමගේවත්තපිටකට්ටිය .. | එම සහ එම හෙලනිස්අප්පු .. .. | එම .. | 0 | 1 | 38 |
| 45 | ගමගේවත්ත .. | එම, (1) එම දොන් සයිමන්, (2) එම පොඩිඅප්පු .. | එම .. | 0 | 1 | 13 |
| 46 | විතානගේවනෙතපිටකට්ටිය | එම, විතානගේ සාදිරිස්අප්පු .. .. | හේන .. | 0 | 1 | 38 |
| 47 | මානාගේවනෙතපිටකට්ටිය | ආණ්ඩුව සහ කුමාරගේ බෙම්පිසිංඤෝ .. .. | එම .. | 0 | 0 | 12 |
| 51 | උඩුමුල්ලේඹිවේගොඩැල්ල | එම සහ එම ආංරත්සිංඤෝ .. .. | පොල් වත්ත .. | 0 | 0 | 12 |
| 52 | ලියන්ගහවත්ත .. | එම, (1) එම්. ඩී. ජී. ජයරත්න, (2) කුමාරගේ ජේම්ස් .. | එම .. | 0 | 2 | 19 |
| 54 | එම .. | එම, එම්. ඩී. ජී. ජයරත්න .. .. | රබර් .. | 0 | 0 | 24 |
| 56 | උඩුමුල්ලේආරාවිගොඩැල්ල | එම, (1) බෝපේආරච්චිගේ ජුලිස්සිංඤෝ, (2) කුමාරගේ හෙනෙරිස්සිංඤෝ යන අයවළුන්ගේ වගාව | එම .. | 0 | 0 | 10 |
| 63 | දෙඩන්ගොඩයාවත්ත .. | ආණ්ඩුව සහ එම්. ඩී. ජයරත්න .. .. | තේ .. | 0 | 0 | 31 |
| 66 | ගල්කැටියවත්ත .. | එම, ඩී. ජේ. විජේවඩීන .. .. .. | පොල්වත්ත .. | 3 | 1 | 22 |
| 68 | කන්දෙගෙදරවත්ත නොහොත් ගල්කැටියේවත්ත | එම .. .. .. | රබර් .. | 0 | 3 | 28 |
| 72 | නාවිලේකුඹුර .. | ආණ්ඩුව, කුමාරගේ ජේම්ස්අප්පුගේ වගාව .. | කුඹුර .. | 0 | 0 | 8 |
| 94 | ලියනගේවත්ත .. | එම සහ (1) දිවාරමොහොට්ටිගේ සර්දියෙල්අප්පු, (2) නාබොඩ ගමගේ හෙන්ද්‍රික්අප්පු, (3) ගමගේ මන්ගොහාමි, (4) දිවකුරගේ ඩේවිඩ්සිංඤෝ | රබර් .. | 0 | 2 | 5 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වෂී 1933ක්වූ අගෝස්තු මස 25වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**No. 10,733, S. O.**—ඉඩම් බේරුම්කරන නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වෂී 1933ක්වූ ඔක්තෝබර් මස 28වෙනි දිනවූ සෙනසුරාදා පෙරවරු 9ට මහගම තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. බස්නාහිර දිසාවේ කළුතර පලාතේ නැගෙණහිර පස්දුන්කෝරලේ ගහබොඩපත්තුවේ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 23ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 139. ගම—කුඩලිගම (කොටසක්).

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 95 | ඉහලගේවත්ත .. | ආණ්ඩුව සහ කුමාරගේ දිනෝරිස්අප්පු .. .. | රබර් .. | 0 | 0 | 37 |
| 96 | අඹගහඹවට .. | එම සහ (1) ගමගේ දොන් සයිමන්, (2) එම උදනිස්අප්පු .. | එම .. | 1 | 0 | 23 |
| 97 | එම .. | ආණ්ඩුව සහ (1) එම දොන් අල්විස් වීරක්කොඩි, (2) එම මාටින් සිංඤෝ | එම .. | 0 | 2 | 23 |
| 98 | රඹඹිට .. | ආණ්ඩුව සහ රනිගේ තොන්යා ප්‍රනාන්දු .. .. | එම .. | 0 | 2 | 18 |
| 99 | උඩිච්චියඹිට .. | ආණ්ඩුව සහ (1) උඩිච්චියාවත්තෙගේ ජීරෝනිස් ප්‍රනාන්දු, (2) එම සෙනෙරිස් ප්‍රනාන්දු | එම .. | 0 | 1 | 14 |
| 102 | මඩල්ඹිට .. | ආණ්ඩුව සහ (1) හොලන්කගේ සෙමනෙරිස් ප්‍රනාන්දු, (2) නන්එදිරිදේවගේ ජිනෝරිස් ප්‍රනාන්දු, (3) කන්දදුරගේ සූරමානිස් ප්‍රනාන්දු, (4) දේවගරමොහොට්ටිගේ ආගිරිස්අප්පු | එම .. | 3 | 0 | 32 |
| 104 | ඉද්දගොඩගේඹිට .. | ආණ්ඩුව සහ එස්. ඒ. මරික්කාර් .. .. | එම .. | 1 | 3 | 19 |
| 105 | රණිඹිට .. | ආණ්ඩුව සහ (1) රනිගේ චාර්ලිස්, (2) එම සුබනේරිස්, (3) එම පීරිස්, (4) නෑබොඩ පදිංචි එම මිසියා, (5) නෑබොඩ පදිංචි එම දෙයිනා | එම .. | 2 | 0 | 26 |
| 107 | උඩිච්චියඹිට .. | ආණ්ඩුව සහ එස්. ඒ. මරික්කාර් .. .. | එම .. | 1 | 2 | 5 |
| 108 | රණිඹිට .. | එම සහ (1) රනිගේ නාඳෙරිස් ප්‍රනාන්දු, (2) එම රාදිරිස් ප්‍රනාන්දු | එම .. | 0 | 2 | 7 |
| 109 | එම .. | ආණ්ඩුව සහ මොහොමඩ් ලෙබ්බේ මරික්කාර් සෙයිනුඩීන් මරික්කාර් | එම .. | 0 | 0 | 25 |
| 110 | එම .. | ආණ්ඩුව සහ එම .. .. | එම .. | 0 | 1 | 15 |
| 111 | එම .. | ආණ්ඩුව .. .. .. | ඹිට .. | 0 | 0 | 10 |
| 114 | ආචාරියාඹිට, හල්කපුරේඹිට | ආණ්ඩුව සහ රනිගේ ඔදිරිස් ප්‍රනාන්දු .. .. | හිස්බිම .. | 0 | 3 | 37 |
| 162 | ඔසවත්ත .. | ආණ්ඩුව සහ (1) කොලන්කගේ සෙමනෙරිස් ප්‍රනාන්දු, (2) උඩිච්චගෙවත්තගේ බෙන්ගෝ | රබර් .. | 0 | 2 | 0 |
| 163 | මුත්තෙට්ටුවත්ත .. | ආණ්ඩුව සහ රනිගේ ඔදිරිස් ප්‍රනාන්දු, (2) එම සිඳෙරිස් ප්‍රනාන්දු | එම .. | 0 | 1 | 31 |
| 164 | එන්දරවතක නොහොත් කොට්ටිකිලාගේ වත්ත | ආණ්ඩුව සහ (1) ඩී. ජේ. විජේවඩීන, (2) හෝට්ටගේ පෑඩිහාමි | හේන .. | 0 | 1 | 0 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 165 | මුත්තෙහෙට්ටුවත්ත .. | ආණ්ඩුව, ඩී. ජේ. විජේවර්ධනගේ වගාව .. .. | රබර් .. | 0 0 14 |
| 173½ | කොන්ගස්පිටහේන .. | එම, කුමාරගේ බෙම්පිසිංඤෝගේ වගාව .. .. | තේ .. | 0 0 7 |
| 174 | එම .. | ආණ්ඩුව සහ (1) රතිගේ සෙදිරිස් ප්‍රනාන්දු, (2) එම සුවාරිස් ප්‍රනාන්දු, (3) එම සුචි ප්‍රනාන්දු, (4) එම පොඩිනා ප්‍රනාන්දු, (5) එම ලියොරිස් ප්‍රනාන්දු, (6) කොලත්තගේ පෙමනේරිස් ප්‍රනාන්දු | හේන .. | 0 0 31 |
| 175 | කන්දවත්ත .. | ආණ්ඩුව සහ (1) රතිගේ හරමානිස් ප්‍රනාන්දු, ( ) එම එමානිස් ප්‍රනාන්දු | රබර් .. | 0 1 18 |
| 179 | අම්බලමේගොඩැල්ලේ පිටකට්ටිය | ආණ්ඩුව, එදිරිසිංහආරච්චිගේ ලියාරිස්අප්පුගේ වගාව .. | වත්ත, (පාරට වෙන් කරපු කෑල්ල) | 0 0 15* |
| 180 | එම .. | එම, එම .. .. | රබර් .. | 0 0 36 |

* බදුදීමට පමණකි.

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1933ක්වූ අගෝස්තු මස 25වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙත්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 10,734, S. O.**—ඉඩම් බේරුම්කරන නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1933ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දිනවූ සඳුදා පෙරවරු 9ට මහගම තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. බස්නාහිර දිසාවේ කළුතර පලාතේ පැසෙණහිර පස්දුන්කෝරලේ ගගබොඩපත්තුවේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 22ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 139. ගම—කුඹලිගම (කොටසක්).

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 190 | එන්දරලන්ද .. | ආණ්ඩුව, දෙන් හෝනිස් විජේවර්ධනගේ වගාව .. | රබර් .. | 0 2 23 |
| 193½ | එන්දරකන්ද .. | එම .. .. | එම .. | 0 0 19 |
| 194½ | එම .. | ආණ්ඩුව, එම්. එස්. මරික්කාර්ගේ වගාව .. | එම .. | 0 0 11 |
| 196 | මුලන්වතුකන්ද .. | එම, ඩී. ජේ. විජේවර්ධනගේ වගාව .. .. | එම .. | 0 0 26 |
| 197 | එම .. | එම .. .. | එම .. | 0 0 9 |
| 207 | අන්තරවතුකන්ද .. | ආණ්ඩුව, එන්. ඩී. පෙරේරා හාමිගේ වගාව .. | එම .. | 0 1 4 |
| 208 | එම .. | එම .. .. | හේන (දියපාරටවෙන්කරපු කෑල්ල) | 0 2 8 |
| 209 | මුලහෙරතුකන්ද .. | ආණ්ඩුව, ඩී. විජේසේකරගේ වගාව .. | රබර් (එම) .. | 0 0 30 |
| 229 | කැකිරිහේන .. | ආණ්ඩුව, මිදුනගේ ජේම්ස්අප්පු සහ තවත් අයගේ වගාව | කිස්බිම .. | 0 0 6* |
| 230 | එම .. | එම, ඩී. ජේ. විජේවර්ධනගේ වගාව .. .. | රබර් (පරනදිය පාරට වෙන් කරපු කෑල්ල) | 0 1 5* |
| 232 | අද්දරවතුකන්ද .. | ආණ්ඩුව, එච්. ඩී. එඩ්වඩ් පෙරේරාගේ වගාව .. | රබර් (දියපාරට වෙන් කරපු කෑල්ල) | 0 0 20* |
| 234 | කැකිරිහේන .. | එම .. .. | එම . | 0 0 14 |
| 235 | එම .. | ආණ්ඩුව, ආර්. ඩී. එන්. විජේවර්ධනගේ වගාව .. | රබර් .. | 0 1 36 |
| 236 | හත්කරහේන .. | එම, පොතුවගේ ඔදිඅප්පුගේ වගාව .. | තේ .. | 0 0 23 |
| 237 | එම .. | එම, බෝපේආච්චිගේ ජූලිස්සිංඤෝගේ වගාව .. | රබර් .. | 0 0 21 |
| 238 | ජලුග්ගෙවත්තෙපිටකට්ටිය . | එම .. .. | තේ (දියපාරට වෙන් කරපු කෑල්ල) | 0 0 38* |
| 240 | පරවැම්බිදෙලලන්ද .. | ආණ්ඩුව, පතිරගේ පොඩිඅප්පුගේ සහ තවත් අයගේ වගාව | රබර් .. | 0 0 8 |
| 241 | එම .. | එම, බදුරලියාගේ බාලහාමි සහ තවත් අයගේ වගාව .. | එම .. | 0 0 16 |
| 257 | එම .. | එම, පතිරගේ චාර්ලිස් අප්පුගේ වගාව .. | එම .. | 0 1 14 |
| 258 | කහහේන .. | එම, (1) බෝපිආරච්චිගේ ජූලිස් සිංඤෝගේ සහ (2) එම සොපිනහාමිගේ වගාව | තේ .. | 0 1 28 |
| 259 | කහහේන .. | ආණ්ඩුව, ඩී. ජේ. විජේවර්ධන සහ තවත් අයවළුන්ගේ වගාව | එම .. | 0 0 35 |
| 262 | එම .. | ආණ්ඩුව, පතිරගේ දිනෝරිස්අප්පු සහ තවත් අයවළුන්ගේ වගාව | රබර් .. | 0 0 21 |

* බදුදීමට පමණකි.

අක්කරයක තක්සේරු මිළ රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ නිලධාරීතුමාගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1933ක්වූ අගෝස්තු මස 25වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෙත්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 579 (පුත්තලම).

මිට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම් වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වම් 1933ක්වූ සැප්තැම්බ මස 1වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත්නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩම්කැයි 1931කේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරණුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වම් 1933ක්වූ ජූලි මස 20වෙනි දින පුත්තලමේ කච්චේරියේදීය.

ජේ. ලයිට්,
පුත්තලමේ වැඩබලන ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

කසල ආදිය උවමනාවූ වාරවලදී අහක්කර දමා හොඳකාර තියාගැනීම එම තොටුපල්කරුවන් විසින් ඔවුන්ගේ වියදමෙන් කරගත යුතුයි.

8. දූනට බඳුකරගෙන යන තොටුපල් කරුවන් විසින් නියම දිනවලට එම මුදල් හරියාකාර ගෙවා නොතිබුනොත් නම් ඔවුන් විසින් ලබන වර්ෂයේ තොටුපල්රේන්ද සම්බන්ධ එව නලද ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

9. යම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රශනයක් නැතුව ප්‍රතික්ෂෙප කිරීමේ බලය කොමිටියේ ප්‍රධානතැන වෙත තබාගන්ට යෙදුනා ඇත.

10. මේ ගැන වැඩිදුර කාරණා කළුතර දිස්ත්‍රික්කයේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැනගෙන් ඉල්ලුම්කළමට දූනගන්ට පුළුවන.

(1) අඟුරුවාතොට තොටුපල් රේන්දය.
(2) බඩුරෙලියේ තොටුපල් රේන්දය.
(3) කලවැල්ලාවේ රේන්දය.
(4) කිතුල්ගහවත්ත රේන්දය.
(5) නාරගල රේන්දය.
(6) රුක්ගහතොටුපල රේන්දය.
(7) වෙරළුගස් නොහොත් ප්‍රොස්ටර්ෆැරි තොටුපල් රේන්දය.

පී. සරවනමුත්තු,
ප්‍රධානතුමා.

වර්ෂ 1933ක්වූ අගෝස්තු මස 26වෙනි දින
කළුතර දිස්ත්‍රික් රෝඩ්කොමිටි කන්තෝරුවේදීය.

---

රත්නපුර දිස්ත්‍රික්කයේ තොටුපල් රේන්දවලට ටෙන්ඩර්පත්‍ර.

වර්ෂ 1934ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 31වෙනි දින දක්වා දොළොස්මාසයකට මෙහි පහත සඳහන්වෙන රත්නපුර දිස්ත්‍රික්කයේ තොටුපල් රේන්ද මිලේට ගැනීම පිණිස දෙනුලබන මුද්දරකරණලද ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1933ක්වූ සැප්තැම්බර් මස 28වෙනි දින පෙරවරු 10 වනතුරු රත්නපුරේ කච්චේරියේදී රත්නපුරේ දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ ප්‍රධානතැන විසින් භාරගනු ලැබේ.

2. (a) මෙහි පහත පෙන්නුම්කර තිබෙනාකාරයට එක එක රේන්දයට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවිය යුතුයි. එවන ඉල්ලුම්කාරයෝ පැමිණ සිටින්ට ඕනෑය. නැත්නම් ටෙන්ඩර්පත්‍ර හරි ඒවා බව නිසි බලයලත් ඒජන්ත කෙනෙක් [illegible] ප්‍රධානතැනට ඔප්පුකරවන්ට ඕනෑය. යම් ඉල්ලුම්පත්‍ර [illegible] හෝ ඉල්ලුම්පත්‍ර සියල්ලම භාරනොගැනීමේ බලයද, [illegible]දයක ඉල්ලුම්පත්‍ර හෝ පත්‍රයක් නොලැබූ තොටුපල් [illegible]දය හෝ රේන්ද එදිනම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ [illegible]ලයද ප්‍රධානතැන වෙත තබාගන්නාලදී.

(b) ඉල්ලුම්පත්‍රවල පිට කවරේ නොහොත් "ඇන්විලොප්" එක මතුපිට වම්පැත්තේ (Tender for Ferry Toll Rent) කියා සලකුණුකරන්ට ඕනෑවනතැර ඉල්ලුම්කරනලද රේන්දේ නම සඳහන්කරන්ට ඕනෑය. තවද ඒවා රත්නපුරේ දිස්ත්‍රික් රෝඩ් කොමිටියේ ප්‍රධානතැන වෙත එවිය යුතුයි.

3. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ තම තමන්ගේ ඉල්ලීමේ ප්‍රකාර දොළොස් මාසයකට ගෙවියයුතු බදු මුදල්වලින් දහයෙන් කොටසක් එදිනම ගෙවිය යුතුයි. තවද කොමිටිය විසින් එකී ඉල්ලුම්පත්‍ර භාරගන්ට යෙදුනොත් එසේ භාරගත් බව දක්වා එවන්ට යෙදෙන දැන්වීම්පත්‍රය ලැබුන දින පටන් 30 දවසක් ඇතුළතදී ඉතුරු මුදල ගෙවන්ට ඕනෑය.

4. රේන්දකාරයා විසින් යාර සියයක් දුර පෙනෙන ආකාර රතු එළියක් සවස 6ටත් උදේ 5.30ටත් අතරතුර රේන්ද පලේ යේට්ටුව දෙපැත්තේ පෙන්නුම්කරන්ට ඕනෑය.

5. රෝඩ් කොමිටියෙන් කොස්වත්තෙ සහ යක්ගහපිටියේ වෙලේ තොටුපල්වලට අඟුල් සපයනු ලැබේ. රේන්ද කාරයෝ ඔවුන්ගේ වියදමෙන් ඒවා ආරක්ෂාකරගෙන නඩත්තු කළ යුතුයි.

6. මේ ගැන වැඩිදුර කාරණා රත්නපුරේ දිස්ත්‍රික්කයේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැනගෙන් ඉල්ලුම්කළමට දූනගන්ට පුළුවන.

රත්නපුර දිස්ත්‍රික්කයේ.

1. කළුගලේ නැගෙණහිර ඉවුරේ කැටෙපොල සිට කුකුළු කෝරලේ ගවරගිරිය දක්වා යන ගම්සභාපාරේ කැටෙපොල තොටුපල් රේන්දය.

2. කුකුළුකෝරලේ මැදපත්තුවේ කලවාණේ සිට ඩැප්ඩින් දක්වා යන සුළු පාරේ කොස්වත්තේ තොටුපල රේන්දය.

3. කුකුළුකෝරලේ වෙව්වැල්කපුරේ සිට දුනුකෙසියාගල දක්වා යන සුළු පාරේ යක්ගහපිටියේ වෙලේ කුකුළුගඟේ තොටුපල රේන්දය.

සී. ජී. පිල්ති,
ප්‍රධානතුමා වෙනුවට.

වර්ෂ 1933ක්වූ අගෝස්තු මස 23වෙනි දින රත්නපුර
දිස්ත්‍රික් රෝඩ් කොමිටි කන්තෝරුවේදීය.

වර්ෂ 1934ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් වර්ෂ 1934ක්වූ දෙසැම්බර් මස 31වෙනි දින දක්වා මෙහි පහත සඳහන්වෙන රත්නපුර දිස්ත්‍රික්කයේ තොටුපල් රේන්ද මිලයට ගැනීම පිණිස දෙන ටෙන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1933ක්වූ ඔක්තෝබර් මස 31වෙනි දින පස්වරු 2ට රත්නපුරේ කච්චේරියේදී සබරගමු පලාතේ ආණ්ඩුවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

2. (a) ඉල්ලුම්කාරයෝ ඒජන්ත උන්නාන්සේ ඉදිරියෙහි පෙනිසිටින්ට ඕනෑය. නැත්නම් බලයලත් කෙනෙකු ලවා ටෙන්ඩර්පත්‍ර නිසි ඒවා බව පෙන්වාසිටින්ට ඕනෑය.

(b) ඉල්ලුම්පත්‍රවල පිටකවරේ නොහොත් "ඇන්විලොප්" එක මතුපිට වම්පැත්තේ උඩ කවරේ "Tender for Toll Rent" කියා සලකුණුකරන්ට ඕනෑවත් ඇර ඉල්ලුම්කරනලද රේන්දේ නම සඳහන්කරන්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේට යම් ඉල්ලුම්පත්‍රයක් පිළිගැනීමට හෝ නොගැනීමට බලය තිබේ.

4. භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයා විසින් 12ක් මාසයක ගත් මුදලෙන් දහයෙන් කොටසක් මුදල්වලින් වහාම මෙහි තබන්ට ඕනෑය. එම ඉල්ලීම ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්ට යෙදුනොත්නම් ඔහුගේ ඉල්ලීම ඒජන්ත උන්නාන්සේ විසින් ඒත්තුගත්බව දූනුම්දුන් දින පටන් සතියක් ඇතුළතදී 12 මාසයකට ඉල්ලූ ගණණින් දෙකෙන් පංගුවකට වටිනා ඇප ඒත්තුගත් මුද්‍ර ඔප්පුවලින් හෝ තුනෙන් පංගුව කට වටිනා ඇප මුදලෙන් හෝ තබා සම්පූර්ණකරන්ට ඕනෑය.

5. ඇප පිණිස තබනලද ඔප්පු සෝදිසිකිරීම සඳහා ආණ්ඩුවේ පෙරකදෝරු උන්නාන්සේට ගෙවියයුතු ගාස්තුවද, ඇප ඔප්පු සෑදීමටද ඒවා සෝදිසිකර සම්පූර්ණකිරීමටද, ඉඩම් තක්සේරුකිරීමට සහ ඇප ඔප්පු රෙජිස්ටර්කිරීමටද, වර්ෂ 1909යේ 22වෙනි ආඥාපණත අන්දමට ඔප්පුවලට අලවන්ට ඕනෑ මුද්දර ගාස්තුවද ඔහු විසින් ගෙවන්ට ඕනෑය.

6. ඇප වෙනුවෙන් තිබනලද ඉඩම්වල ඔප්පු, ඒවා මිට ප්‍රථම ඇපේකට නොහොත් උකසකට යටත්වී නැතිබවට ඉඩම් ලියාපදිංචිකරණ රෙජිස්ත්‍රාර්තුමාගෙන් සහතිකපත්‍රයක් ලබාගත යුතුයි. මේ සහතිකපත්‍රය ලබාගැනීමට ඕනෑකරණ වියදම ඇප තබන අය විසින් දැරිය යුතුයි.

7. මේ ගැණ වැඩිදුර කාරණා සබරගමු පලාතේ ආණ්ඩුවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන් ඉල්ලුම්කළමට දූනගන්ට පුළුවන.

රත්නපුර දිස්ත්‍රික්කයේ.

(1) කලවාණේසිට කුකුලේගම දක්වා යන ගම්සභා පාරේ නාවන්නාගොඩ තොටුපල රේන්දය.

(2) යක්ගහපිටියේ සිට දෙල්ගොඩ දක්වා යන ගම්සභා පාරේ කඳුරුකොටඇල්ලේ තොටුපල රේන්දය.

(3) කුරුගම්මෝදර සිට කහන්ගම දක්වා යන ගම්සභා පාරේ පෝරුඇලමෝදර තොටුපල රේන්දයද.

සී. ජී. පිල්ති,
සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1933ක්වූ අගෝස්තු මස 25වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

---

## රජසන්තක ඉඩම් මැනීම ගැණ දැන්වීමයි.

### වයඹ දිසාවේ ආණ්ඩුවේ ඉඩම් ඉල්ලුම්පත්‍රපිට මැනීම සම්බන්ධව දැන්වීමයි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ නො. එකේ කොට්ඨාසය හැටියට සලකන කටුගම්පොල හත්පත්තුවද, දේවමැදිහත්පත්තුවද, දඹදෙනිගත්පත්තුවද, වැළිඹිල්ලිගත්පත්තුවද, හිරියාල හත්පත්තුවේ තිත්තවැලිගන්දහය, හැටහය, ඉහලවිසිදෙක යන කෝරලද, කිඹුල්වානාඔයෙන් දකුනට පිහිටි මහගල් බොඩ එංගාඩකෝරලේ කොටසක්ද, ඉල්ලුම්පත්‍රපිට ඉඩන් මැනීමට වර්ෂ 1933ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින තීරණය කරණු ලැබේ.

එබැවින් එකී දිනට පසු ලැබෙන ඉල්ලුම්පත්‍ර මෙම කොට්ඨාසයේ තීරණයක් නැවත කරණතුරු මැනීමට පිටත්කරණු නොලැබේ. කාරණා එසේවුවත් ලියාපදිංචිකර තැබීම පිණිස හෝ යම්කිසි බිමක් විකිණීම බදුදීම ආදී පිළිබඳ කාරණා සෝදිසිය පිණිස හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත්කිරීමට බාධාවක් නැත.

සී. හැරිසන් ජෝන්ස්,
වයඹ දිසාවේ ඒජන්තතුමා වම්හ.

වර්ෂ 1933ක්වූ අගෝස්තු මස 26වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS. COLOMBO.